**තංගල්ල නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-----------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-----------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
------

මෙම වාර්තාවේ **1.3.2** හා **1.3.5** ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණු අතර ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අතැති තොගයේ වටිනාකම රු.506,992 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ඉදිපොකුණගොඩ උතුර රෙදි ගෙදර පළමු හරස් මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව ලැබිය යුතු හෝ ගෙවිය යුතු ශේෂයක් නොතිබුණු නමුත්, රු.238,457 ක් බැගින් ණයගැති හා ණයහිමි ශේෂ ඇතිකර තිබුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**
------------------

දීර්ඝ කාලයක සිට සභාවට අයවිය යුතුව ඇති, එකතුව රු. 2,109,217 ක් වූ හිඟ තානායම් කුලී අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

--------------------

1997 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයට අදාළව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු එකතුව රු.4,125,808 ක් වූ දායක මුදල් සහ එකතුව රු. 269,568 ක් වූ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

එකතුව රු.8,401,782 ක් වූ විවිධ තැන්පත් සම්බන්ධයෙන් උපලේඛනද, රු.3,540,530 ක් වූ ණයගැති ශේෂ ලියා හැරීම් සම්බන්ධ ලිපිගොනුද, රු.1,125,010 ක් වූ නඩු පවරන ලද හිඟ ආදායම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ සහ උපයෝගී ලේඛනද, රු.906,960ක් වූ ස්ථාවර තැන්පත් සම්බන්ධයෙන් ස්ථාවර තැන්පතු සහතිකද, ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------

2015 මැයි 21 දිනැති අංක 15/විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික් පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු. 38,141 ක වියදම් දරා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,253,327 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.951,312 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 302,015 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම මුළු පුනරාවර්තන ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 98 ක අගයක් ගෙන තිබුණු නමුත්, එම තත්ත්වය හඳුනාගෙන වියදම් අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ දෙකෙහි සහ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සලකා බැලීමේදී සෑම වර්ෂයකම සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වර්ධනය වී ඇතිබව පෙන්නුම් කෙරුණි.

(ඇ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින්, කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට හැකියාව නොලැබෙන බව පෙන්නුම් කෙරුණි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 වරිපනම් හා බදු

-----------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති හිඟයෙන් සියයට 36 ක් පමණක් වර්ෂය තුළදී අයකර ගෙන තිබූ අතර, වර්ෂය අවසානයට හිඟ වරිපනම් හා බදු ශේෂය රු. 2,110,799 ක් විය. නගර සභා ආඥාපනතේ 170 (අ) ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.2 බදුකුලී

--------

වර්ෂය ආරම්භයට පැවති රු.2,675,838 ක් වූ හිඟ බදුකුලී ශේෂයෙන්, වර්ෂය තුළ සියයට 12 ක් තරම් අවම අගයක් අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 2,552,917 ක් වී තිබුණි. හිඟ බදුකුලී අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 (අ) (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.3 කඩ කාමර බදු

---------------

පහත දැක්වෙන කරුණු කරනු ලැබේ.

(අ) ජයසිංහවත්ත කඩ කාමර බදු

--------------------------------

(i) ජයසිංහවත්ත ඉඩමේ ඉදිකර තිබූ කඩ කාමර 27 න් කඩකාමර 16 ක් බදු දීම සඳහා 2009 ජුනි 25 දින ද, ඉතිරි කඩ කාමර 11 සඳහා 2011 ජනවාරි 06 දින ද ගිවිසුම් අත්සන් කර තිබුණි.

(ii) ගිවිසුම් අත්සන් කර තිබුණද ගොඩනැගිල්ල විවෘත කර අදාළ පාර්ශවයන් වෙත කඩ කාමර ලබාදී බදුකුලී අයකර ගැනීමට 2016 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) පොදු වෙළඳපොළෙහි තිබූ කඩ කාමර, කඩා ඉවත් කිරීමේ පදනම මත එහි බදුකරුවන් 15 දෙනෙකුට කඩකාමර 15 ක් ලබාදීමට 2009 වර්ෂයේදී ගිවිසුම්ගතව තිබුණද, පොදු වෙළඳපොළෙහි කඩ කාමර කඩා ඉවත් කිරීමට 2016 ජුනි 30 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

**(ආ) තංගල්ල බස් නැවතුම්පොළ කඩ කාමර**

---------------------------------------

තංගල්ල බස් නැවතුම්පොළෙහි උඩු මහලේ පිහිටි කඩකාමර 24 ක් ධීවර නීතිගත සංස්ථාව විසින් 2008 වර්ෂයේදී තංගල්ල නගර සභාව වෙත පවරා දී තිබූ නමුත්, එම කඩ කාමර තක්සේරු කර කුලී මුදල් අය කිරීමට 2016 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යසාධන ඇගයීම
---------------------

ආරක්ෂක නියාමන ව්‍යාපෘතිය සහ කසළ ඉවත් කිරීමේ වැඩසටහනක් වෙනුවෙන් අයවැය ලේඛනය මගින් එකතුව රු. 6,413,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත්, එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තියට අනුකූල නොවී මාසිකව ස්ථිර පරිවර්තිත ගමන් වියදම් දීමනාවක් ලබන සහ රාජකාරි කටයුතු සඳහා රජය විසින් යතුරුපැදි ලබා දී තිබූ, සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට රාජකාරි කටයුතු සඳහා සභාවේ වාහනද ලබාදී තිබුණි.

(ආ) සේවය අතහැර ගිය සේවකයින් 15 දෙනෙකුගෙන් හා මියගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.110,490 ක් වූ හිඟ ණයශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන්, 2015 ඔක්තෝබර් 09 දිනැති අංක FD/RFD/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 4.3 (ආ) සහ (ඉ) යන ඡේදවල දක්වා ඇති නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

3.3 කාර්ය මණ්ඩල කළමනාකරණය
------------------------------------

අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 05 ක 18 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 15 ක 48 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම, පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
--------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 06 ක එකතුව රු44,012,434 ක් වූ ඉතිරි කිරීමද, ආදායම් විෂයයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.42,543,035 ක් සහ ස්වයං උත්පාදන ආදායම් වලින් සියයට 30 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර නොතිබීමත් යනාදී හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-----------------------

2014 පෙබරවාරි 24දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියකු පත්කර තිබුණද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

---

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

---

**භාණ්ඩ සමීක්ෂණය**

---

සමාලෝචිත වර්ෂයේ කාර්යාලයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් භාණ්ඩ වර්ග 157 කට අයත් ඒකක 2,080 ක ඌනතාවයක් ද, සභාවේ ගිණි නිවන ඒකකයට අදාළ භාණ්ඩ වර්ග 62 කට අයත් ඒකක 130 ක ඌනතාවයක්ද අනාවරණය කරගෙන තිබුණුද, එම ඌනතාවයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**4.5 බේරුම් නොකළ බැරකම්**

---

සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු. 9,225,586 ක් විය. ඊට වසර 5 ක කාලයක් ඉක්මවූ රු.3,323,249ක ශේෂයන්ද, වසර 3 ක කාලයක් ඉක්මවූ රු. 443,316 ක ශේෂයන්ද, ඇතුළත් වී තිබුණු නමුත්, එම ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.6 නොවිසඳී ඇති විගණන විමසුම්**

---

2012 හා 2013 යන වර්ෂවල තංගල්ල නගර සභාවේ සේවකයින්ගේ වැටුප් හා දීමනා ඉක්මවා වැඩිපුර ප්‍රතිපූර්ණය කර තිබුණු එකතුව රු. 9,147,970ක මුදල නැවත ගෙන්වා ගැනීමට හෝ ඉදිරි වැටුප් ප්‍රතිපූර්ණ වලින් හිලව් කර ගැනීමට හෝ 2016 ජුනි 21 දින වන විටත්, දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය